

සබරගමු අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Covid 19 - සති පාසැල් වැඩ සටහන
නර්තන විෂය
13 වසර



නිපුනතාව - 6 නිපුනතා මට්ටම - 6 .1

පාඩම - ගම්පල යුගය, කෝට්ටේ යුගය, මහනුවර යුගය, කොළඹ යුගය.

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. 'විදෙන ලෙළෙන තරු බර පුළු ලුකුලද රැඳී', මෙම පදය පාදය ඇතුළත් වන්නේ කුමන යුගයට අයත් කවර සංදේශයකද?
   i. ගම්පොල යුගයේ මයුර සංදේශයේ,
   ii. කෝට්ටේ යුගයේ තිසර සංදේශයේ
   iii. කෝට්ටේ යුගයේ සැවුල් සංදේශයේ
   iv. කෝට්ටේ යුගයේ සැලළිහිණි සංදේශයේ

02. ඇම්බැක්කේ දේවාලයේ ලී කැටයම් කලාව අයත් යුගය කුමක්ද?
   i. ගම්පොල
   ii. අනුරාධපුර
   iii. මහනුවර
   iv. පොළොන්නරු
   v. කුරුණෑගල

03. දෙවින්දර උපුල්වන් දේවාලෙහි කෙරුණු නර්තන පිළිබඳ මයුර සන්දේශයේ මෙසේ ලියා ඇත.
   i. ' තහලම් කල බෙර තම්මැට පට තනිතිරි ඩමුරු '
   ii. ' ලෙලවන දිගුනෙත නිලුපුල් සේයා - ලෙලපවනින් රන් ලියවිල සේවා '
   iii. ' රළලා උපුලා ලෙළුම තුලායා - නෙතලා බැමලා බමවාලායා '
   iv. ' අඳිමින් සුදු පට සළුහෙල සඳුනෙන් තුනු තවරා '
   v. ' ලකල පුළුලුකුල බඳ මිනි මෙවුල්ලා - සමග රන් සළඹ රැවුදී මෙවුල්ලා '

04. සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන්නේ,
   i. ගම්පොල යුගය
   ii. කෝට්ටේ යුගය
   iii. කුරුණෑගල යුගය
   iv. කොළඹ යුගය
   v. දඹදෙනි යුගය

05. කෝට්ටේ යුගයට අයත් නොවන සන්දේශ කාව්‍ය ඇති වරණය,
   i. පරවි , කෝකිල හා හංසවේ
   ii. සැවුල් , සැළලිහිණි හා පරවි වේ
   iii. පරවි , හංස හා සැළලිහිණි වේ.
   iv. හංස, සැවුල් හා පරවි වේ.
   v. මයුර , තිසර හා කහකුරුළු වේ.

06. මහනුවර ඇසල පෙරහැර විදිමත් ආකාරයෙන් සංවිධානය කරන ලද්දේ ,
   i. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කාලයේය.
   ii. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍ර සිංහ රජුගේ කාලයේය.
   iii. vi වන බුවනෙකබාහු රජුගේ කාලයේය.
   iv. කීර්ති ශ්‍රී රාංජසිංහ රජුගේ කාලයේය.
   v. විජයභාහු රජුගේ කාලයේය.

07. ජාතික අධ්‍යාපාන ආයතනයේ සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව බිහි වූයේ ,
   i. 1968 දීය
   ii. 1959 දීය
   iii. 1986 දීය
   iv. 1956 දීය
   v. 1943 දීය

- හිස්තැන් පුරවන්න.

08. අධ්‍යනය පොදු සහිතක පත්‍ර උසස් පෙළ විෂය ධාරාවට සෞන්දර්ය විෂය ................................ වර්ෂයේදී ඇතුලත් වූ අතර ................................ වර්ෂයේදී සෞන්දර්ය විශ්ව විද්‍යාල ස්වාධීන විශ්ව විද්‍යාලයක් බවට පත් වේ.
09. 1918 දී ........................................... විසින් සාම්ප්‍රදායික උඩරට වෙස් නැටුම මහනුවර ............................................. එක් කරන ලදී.
10. ශ්‍රී ලංකාවේ කාන්තා නර්තනයේ පුරෝගමීන් ලෙස ................................ හා ................................ මහත්මීන් දෙපල සකනු ලබයි.

## II කොටස

01. දේශීය නර්තන කලාව විකාශනය වීමේදී රජ්‍ය අනුග්‍රහය මෙන්ම ගැමි නර්තන කලාවද දියුණුව පැවැති බවට මූලාශ්‍ර මගින් හෙළිවේ.

    i. 1970 දශකයේ නර්තන කලා අධ්‍යාපනය ප්‍රවර්ධනයට ලැබුණු රාජ්‍ය අනුග්‍රහය සාධක 4 ක් ඇසුරෙන් විමසන්න.

    ii. දේශීය නර්තන කලාවේ විකාශනයේදී ගැමි නැටමුටද සුවිශේෂී ස්ථානයක් හිමිව ඇත. ඒ බව සනාථ කිරීමට ගම්පොල යුගයෙන් හා මහනුවර යුගයෙන් සාධක 02 ක් ඉදිරිපත් කරන්න.

    iii. එම සාධක ඔස්සේ එකල ගැමි නර්තන කලාව කුමන ආකාරයකට තිබුනේදැයි ඔබේ අදහස් දක්වන්න.

02. දේශීය නර්තන කලාව තුල කාන්තා නර්තනය හා විදේශීය අභාෂය දක්නට ලැබේ.

    i. කෝට්ටේ යුගයේ ලියැවුණු සන්දේශ කාව්‍ය දෙකකින් උදාහරණ ගෙන එකල කාන්තා නර්තනයේ ලාලිත්‍ය පිළිබඳ අගයන්න.

    ii. දේශීය නර්තන කලාවට බලපෑ භාරතීය ආභාෂය කෙතරම්ද යන්න ගම්පොල යුගයෙන් හා මහනුවර යුගයෙන් උදාහරණ ගෙන විස්තර කරන්න.

    iii. ප්‍රජාපර්ථය පදනම්ව ගොඩ නැගුණු දේශීය නර්තන කලාව ක්‍රමයෙන් විනෝදය සඳහා යොදා ගැනීමට ගමන් කල ආකාරය පැහැදිලි කරන්න.

සැකසුම : ඩී. කේ. ජයසිංහ , ඇහැලියගොඩ ම.ම.වි